# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2477/36 - 2026 පෙබරවාරි මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2026.02.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KDS/DOL/04/04/05/3/18.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : 4-3/9/2014/WS/139.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳුකර පහළ කෝරළේ අංක 1155 දොළුව ග්‍රාම නිලධාරි වසමේ මැදපිටිය යන ගමේ පිහිටි මැනුම්පති විසින් මැන පිළියෙළ කරන ලද කැඩැස්තර සිතියමේ අංක 320026 කලාප 1, පත්‍ර අංක 8 හා 2021.08.20 දිනැති පිඹුරේ කැබැලි අංක 185 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්. 0.0665ක් පමණ වන පහත සඳහන් මායිම් තුල පිහිටි ලියොවත්ත සහ ඔරුව කෙටුහේන නමැති ඉඩම් කොටස :

**01. කැබලි අංක 185**
ඉඩමේ නම: ලියො වත්ත සහ ඔරුව කෙටුහේන; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ පවරා ගන්නා ලදී; මුල් හිමිකම් කියන අය:පී. ආර්. සීලවතී සහ වන්දිමා කුමාරි ලියන්දෙනිය, අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා; ප්‍රමාණය: හෙක්. 0.0665.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන්ගෙන් හෝ 2026.04.20 වැනි දින පෙ.ව. 10.00ට දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2026.03.20 දිනට මත්තෙන් ඒ ඉඩම පරවශතාවය සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**ඩබ්. ජී. යමුනා දයාරත්න,**
ප්‍රාදේශීය ලේකම්,
දොළුව.

2026 පෙබරවාරි මස 20 වැනි දින,
දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02 - 0211


1A - G 46357 – 25 (2026/02)



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ශුද්ධි පත්‍රිකාව**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : මීරි/ප්‍රාලේ/ඉ/3

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියට යටත්ව අංක 2391/06 හා 2024.07.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ 3 A පිටුවේ සඳහන් කැඩැස්තර සිතියම් අංක 510233හි කලාප 03 පත්‍ර 15හි කැබලි අංක 36 පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

කැඩැස්තර සිතියම් අංක 510233හි කලාප 03 පත්‍ර 18හි,

**01. කැබලි අංක 01**

ඉඩමේ නම: කදුරුගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: මඩිතියවල අප්පුහාමිලාගේ නිලන්ත දර්ශන අභයසිංහ, අංක 63/2, මිදෙල්ලවල, පල්ලෙවෙල (අත්කර ගැනීමේ කටයුතු අවසන් කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0083.

**02. කැබලි අංක 02**

ඉඩමේ නම: කදුරුගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අවසතු කිරීම සඳහා; ප්‍රමාණය: හෙක්. 0.0059.

**ඩබ්. පී. ප්‍රසාද් ඉන්දික,**
ප්‍රාදේශීය ලේකම්,
මීරිගම.

2026 පෙබරවාරි මස 16 වැනි දින,
මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02 - 0212

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.